

කුසුම්සිරි ලියනාරච්චි සහ යසෝදරා සරච්චන්ද්‍ර සුසංයෝගය

# පුංචි අන්දරේ සහ දේව වස්ත්‍රය ගෙනෙයි

කුසුම්සිරි ලියනාරච්චි සහ යසෝදරා සරච්චන්ද්‍ර සුංසයෝගය ළමා නාට්‍ය කලාවට කරමින් පවතින මෙහෙය අපමණයි. මෙයට පෙර ඔවුන් අප හමුවට ගෙන ආ දඟයා හා මුත්තගෙ විත්ති නාට්‍යය අපේ සිතේ ඇති කළ රසය කිසිදා නොමැකෙන එකක්. ළමා නාට්‍ය වැඩ මුළු හරහා ඔවුන් විසින් මෙල්බන් නාට්‍ය කලාවට කර ඇති සේවයේ තවත් එක පියවරක් ඉදිරියට තබමින් පුංචි අන්දරේ සහ දේව වස්ත්‍රය නමින් නාට්‍ය ද්විත්වයක් 2010 සැප්තැම්බර් 11 වන සෙන-සුරාදා ඩැන්ඩිනොන් හි ඩ්‍රම්ස් තියටර් හිදී සවස 2.30 ට සහ 6.30 ට පැවැත්වීමට දැන් කටයුතු සූදානම්. අද මුහුණට මුහුණ තුළින් අපි කුසුම්සිරි ලියනාරච්චි රංගවේදියා මුණ ගැසෙන්නෙ මේ ගැන කතා කරන්න

**ශ්‍රීනාත්**

ඔබ මේ දක්වා මෙල්බන් වේදිකාවට නිර්මාණය කළ නාට්‍ය සියල්ලම වගේ ළමා නාට්‍ය. නමුත් මෙවර ඔබ දේව වස්ත්‍රය නිර්මාණය කළේ වෙනත් ප්‍රේක්ෂක පිරිසකට නේද?

**කුසුම්සිරි**

ඒක හරි. දේව වස්ත්‍රය නාට්‍යය මූලිකවම වැඩිහිටි ප්‍රේක්ෂකාගාරය උදෙසා නිර්මාණය කළ නාට්‍යයක්. ඇත්තටමඑ ය දේශපාලන ප්‍රහසනයක්.

**ශ්‍රීනාත්**

එතකොට පුංචි අන්දරේ?

**කුසුම්සිරි**

පුංචි අන්දරේ නාට්‍යයේ මූලික පරමාර්ථය අපේ ළමුන්ට අපේ ජන සාහිත්‍යය සමීප කරවීම කිව්වොත් හරි. අන්දරේගෙ කතාන්දර කියන්නෙ අපේ ලාංකික ජනකතා අතරින් ඉතාමත්ම ප්‍රසිද්ධ කතා. බොහෙ-ාමයක් වෙලාවට අපට අන්දරේ කියූ පමණින් අපේ මතකයට එන්නෙ රාජ කවටයා. නමුත් මේ අන්දරේගේ ළමා අවදිය ගැන ජන කතා රාශියකුත් තියෙනවා. ඉතින් පුංචි අන්දරේ තුළින් ජන සාහිත්‍යයේ ප්‍රචලිත කතා කීපයක් ඇසුරුකොට ගෙන නව ආරක නිර්මාණයක් කරන්න අපි උත්සාහ ගන්නවා. මෙය ළමුන් තුළ පමණක් නොවෙයි වැඩිහිටියන් තුළත් අපේ කම තවරන්න ගත් උත්සාහයක්. අපේ කම සිහිපත් කරන්න ගත් උත්සාහයක්.

**ශ්‍රීනාත්**

මේ නාට්‍ය ද්විත්වයම රචනා වුණේ ඔබේ අතින්. මේ ගැන යමක් කියන්න පුලුවන්ද?

**කුසුම්සිරි**

මම හැමවිටම උත්සාහ ගන්නවා අපේ ජන සාහිත්‍යයේ සැඟවුණ රස එක්තැන් කර ප්‍රේක්ෂකයා ගේ සිතේ අපේ කම පිළිබඳ හැඟීමක් ඇති කරන්න. ඔවුන්ට නව නලු රසයම ලබා දෙන අතරම ඔවුන්ගේ සිත් තුළ යමක් තැන්පත් කරන්න මම උත්සාහ ගන්නවා. මේ නාට්‍ය දෙක රචනා කරද්දිත් මගේ හිතේ තිබුණෙ ඒ වගේ හැඟීමක්.

**ශ්‍රීනාත්**

මේ නාට්‍ය ද්විත්වය සඳහා ඔබට සහය වන අය ගැන කිව්වොත්

**කුසුම්සිරි**

දයානන්ද විමලසිරි චින්තක සමරකෝන් ප්‍රසාද් විජයබන්දු ප්‍රසන්න කුරුකුලරත්න වසන්ත මුතුමාල සුසන්ත විජේසිරි තුසිත දසනායක රත්නා ගුරුසිංහ කණිෂ්ක රාජපක්ෂ ධර්මසිරි ජයසිංහ යන වැඩිහිටි රංගන ශිල්පීන් සමග ළමා රංගන ශිල්පීන් රැසක් එක්වෙනවා. නම් වශයෙන් කියනවා නම්

තිළිණි රණසිංහ වසුන්දරා ඕපනායක හසිනි ඉලංගරත්න නෙවිල් වල්පොල රන්දු වල්පොල නිමාෂි පැල්පොල මංජිත විජේසිංහ වෙත්මා මල්ලව නුවන් රණසිංහ කසුන් මුණසිංහ මනීෂා ගමගේ තිලාන් ගමගේ කසුනි පාදුක්කගේ දිමිති කස්තුරිරත්න දිලීසා වල්පොල ලක්ෂාන් වල්පොල කාවින්ද මුණසිංහ සම්මානි සේනාරත්න ජනනි මුණසිංහ ජනනි 'සේනාරත්න මධූර බණ්ඩාර ජනනි කුරුකුලරත්න නිලූෂි ජයරත්න විනුකි මල්ලව අමානදී දිසානායක දිලිත විජේසිංහ තරුෂි ෆර්නැන්ඩු තිෂාරා කත්‍රිආරච්චිගේ ඉසිනි බුත්ගමුව තරුෂ පීරිස් දෙව්මි බණ්නැහැක අයන්ගි කුමාරනායක ෂෙහාන් ඩි මෙල් අර්චනා අත්ලගේ නිලිනිකා පස්හැන්න දිහිනි ලියනාරච්චි

**ශ්‍රීනාත්**

අනෙක් අංශ වලින් සහය වන අය කව්ද?

**කුසුම්සිරි**

නාට්‍ය දෙකේම වේදිකා පරිපාලනයෙන් තුසිත දසනායක නිශ්ශංක මල්ලව සහ රොෂාන් ද රංග ආලෝකයෙන් සුජිත් බණ්ඩාර ද දායක වෙනවා.

**ශ්‍රීනාත්**

සංගීතය ඔබේ නාට්‍ය වල ඉතා කැපී පෙනෙන අංගයක්. මේ නාට්‍ය වල සංගීත නිර්මාණ කාගෙද?

**කුසුම්සිරි**

පුංදි අන්දරේ හි තනු නිර්මාණය කළේ යශෝදරා සරච්චන්ද්‍ර. දේව වස්ත්‍රයේ සංගීත නිර්මාණය කළේ භානුක මනෝරත්න. ඒ වගේම මේ නාට්‍ය දෙකේම සංගීතය මෙහෙයවන්නෙත් භානුක මනොරත්න මයි.

වසර තුනක කාලයක් තිස්සේ උසස් නිර්මාණ රැසකින් අප රසවත් කළ කුසුම්සිරි යශෝධරා සුංසංයෝගය මෙවරද පුංචි අන්දරේ සහ දේව වස්ත්‍රය තුළින් අපේ ප්‍රේක්ශකාගාරය රසවත් කරනු නියතයි. ඒ වෙනුවෙන් ඔවුනට සුබ පතන්නට සන්නස එක් වෙනවා.

මේ නාට්‍ය පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීමට 03 8794 9818 ඔස්සේ ඔවුන් අමතන්න ඔබට පුලුවන්.



හා.. හා.. අලියො ගේන්නෙ නැහැ මෙහෙ.. අලි කොටි හංසයො ඔක්කොම පිස්සු කෙළින කාලයක් මේක..

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

---

ලංකා ජර්මානු කර්මාන්ත අභ්‍යාස ආයතනයෙන් ක්‍රිකට් විනිසුරු පදවියට ආ

# හිරන්ජිත් සරත් කුමාර

ක්‍රිකට් කරගයකදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන කෙනෙකු ලෙස තරග විනිශ්චයකරුවන් හඳුන්වන්න පුලුවන්. ක්‍රීඩා සමාජ දෙකක් අතර නැත්නම් පාසල් දෙකක් අතර හෝ රටවල් දෙකක් අතර



සිදුවන ද්වන්ධ යුද්ධයක් වැනි තරගයකදී ක්‍රීඩා ලෝලීන් ලක්ෂ සංඛ්‍යාත ගණනකගේ අවධානය තමන් නියෝජනය කරන කණ්ඩායම කෙරහි යොමු වීම වැළැක්වි නොහැකියි. ක්‍රිකට් ක්‍රීඩාවේ පමණක් නොව ඕනෑම ක්‍රීඩාවකදී මෙය නියත වනශයෙන්ම සිදුවන දෙයක්. විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාවේදී නිමේෂයකින් විනිසුරුවන් දෙන තීරණ වල නිවැරදි බව බොහෝ විට




තරගයක ජය පරාජයට සෘජුවම බලපෑම නොවැළැක්විය හැකියි. ඒ විනිසුරුවන්ගේ දුර්වල තීරණයක් හෝ දෙකක් යම් කණ්ඩායමකට පරාජය අත්කර දීමට ඉවහල් විය හැකියි. ඒ නිසාම පසුගිය දශකයකට වැඩි කාලාන්තරයක් තුළ ශ්‍රී ලංකාවේ පමණක් නොව ක්‍රිකට් ක්‍රීඩා කරන සියලුම රටවල ක්‍රීඩා විනිසුරුවන්ට මනා පුහුණුවක් ලබා දී ඔවුන්ගේ ප්‍රායෝගික හා අනෙකුත් සියලුම දක්ෂතා අගැයීමට ලක් කරමින් ශ්‍රේණිගත කිරීම සිදුකරනවා. මෙම ශ්‍රේණි ගත කිරීමේ දී ඉහළට එන විනිසුරුවන්ට ක්‍රම ක්‍රමයෙන් ජාත්‍යන්තැර තරග විනිශ්චය කිරීමේ අවස්ථාව ලබා ලැබෙයි. මෙම වැඩ පිළිවෙල ඉතා සාර්ථක එකක් බව හැඟී යන්නේ වෙනදා මෙන් කරග විනිසුරුවන්ගේ දුර්වල තීරණ ගැන ලොව වටා ආන්දෝලන සුලබව දැන් දැන් අසන්නට නොලැබෙන නිසා-වෙනි.

ශ්‍රී ලංකාවෙන්ද දැන් තරුණ අත්දැකීම් බහුල දක්ෂ විනිසුරුවන් බිහිවෙමින් පවතියි. කෙසේ වුවද පසුගිය දා ගාල්ලේ පැවැත්වූ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර මුරලිගේ අවසන් තරගය වූ ඓතිහාසික ටෙස්ට් තරගයේ දී ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා ගමනේ මුල්ආරම්භය සනටුහන් කළ විනිසුරුවකු සමග කෙටි කතා බහක

යෙදෙන්නට මට අවස්ථාව ලැබුණා. මෙම තරගයේ අතිරේක විනිසුරු ලෙස කටයුතු කළ නමින් හිරන්ජිත් සරත් කුමාර නම් වූ ඔහු කලුතර දිස්ත්‍රික්කයෙන් බිහි වූ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක්.

එවකට තුන්

ඉරියව්වෙන්ම දස්කම් දැක්වූ හිරන්ජිත්ට ඔහුගේ පන්දු යැවීමේදී පිට දඟ හා පා දඟ පන්දු මිශ්‍ර කරමින් පන්දු යැවීමට තිබූ හැකියාව එදා ප්‍රතිවාදී පිතිකරුවන්ට තිබූ විශාල තර්ජනයක් වුණා. එමෙන්ම ඒ සුවිශේෂී අත්දැකීම් අදටත් ඔහුට ක්‍රීඩා විනිසරු-වකු ලෙස නිවැරදි තීරණ ගැනීමට අත්වැලක් වන බව ඔහු පවසයි.

එදා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නියෝජනය කළ ප්‍රබල ක්‍රීඩකයකු වන හිරන්ජිත් සරත් කුමාර ලංකා ජර්මානු කර්මාන්ත අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍යයෙකි. ඔහුගේ ක්‍රීඩා ජීවිතය ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් වෙන්වූ එකක් ලෙස හැඳින්විය නොහැක්කේ එවකට ශ්‍රී ලංකාවේ සිටි දක්ෂතම මේසපන්දු ක්‍රීඩකයන් කීප දෙනාගෙන් කෙනෙකු

ලෙසද ඔහු නම් දරා සිටි හෙයිනි. අදටත් ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අභ්‍යාස ඉංජිනේරුවරයකු ලෙස සේවය කරන අතරතුර ක්‍රීඩා විනිසුරුවකු ලෙස ඉතා කාර්ය බහුල ජීවිතයක් ද ගෙවයි.

කෙසේ වෙතත් ඉතා කැපවීමකින් තම රාජකාරියට යොමු වී සිටි ඔහු සමග තරග අවසානයේදී කළ කෙටි කතා බහෙන් ක්‍රිකට් තරග



විනිශ්චය ගැන ඔහු ලබා ඇති දැනුම් සම්භාරය ඉතා මැනැවින් වටහා ගන්නට අපට හැකි විය. තරගයකදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ක්‍රිකට් තණතිලි වල විවිධාකාර හැසිරීම් තීරණවලට බලපාන ආකාරය වැනි බොහෝ කාරණා පිළිබඳ ඔහුගේ දැනුම ඉතා උසස්.

අවසානයේ මුරලිගේ අවසන් ටෙස්ට් තරගය ලෙස ඓතිහාසික වටිනාකමක් ඇති. තරගයකින් ජාත්‍යන්තර ක්‍රීඩා විනිසුරු ක්ෂේත්‍රයට පබා තෙබූ ඔහුට මෙල්බන් ක්‍රිකට් ක්‍රීඩා පිටියේ තරග විනිශ්චයකදී නැවත අපට හමු වීමට ලැබේවායි පතමින් මම සමු ගත්තෙමි.

අසෝක සිල්වා




